**රුහුණ විශ්වවිද්‍යාලය - 2014**

රුහුණ විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතුව තිබුණද විශ්වවිද්‍යාලය සතු ඉඩම් වලින් කොටසක් පමණක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 ප්‍රකාරව බැංකු අයිරා අනෙකුත් ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වුවද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන හා ප්‍රාග්ධන බැංකු ජංගම ගිණුම් දෙකෙහි එකතුව රු. 108,713,032 ක් වූ අයිරා ශේෂය මුදල් හා බැංකු ශේෂයෙන් හිලව් කිරීමෙන් ඇති වූ රු . 48,021,864 ක බැංකු අයිරාව ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හා රුහුණ විශ්වවිද්‍යාලය අතර වූ අවබෝධතා ගිවිසුමට අනුව ඇතිකරගෙන තිබූ අරමුදලින් රු.12,110,019 ක ප්‍රාග්ධන ස්වරූපයේ මිලදී ගැනීම් සිදුකර තිබුණද එකී වටිනාකම වත්කම් ගිණුම් වලට මාරුකර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ණය පදනම මත මිලදී ගෙන තිබුණු රු. 1,290,669 ක් වූ යන්ත්‍ර උපකරණ හා කාර්යාල උපකරණ ගිණුම් ගත කර නොතිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෘෂි පීඨයේ හා වෛද්‍ය පීඨයේ ගිණුම් විෂයයන් 20 කට අදාල ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂයන් සමග සැසඳීමේදී රු. 1,499,057 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2014 දෙසැම්බර් 31 දිනට ගොවිපොළ සතු ජීව තොගයේ වටිනාකම රු. 1,796,510 ක් ලෙස තක්සේරු කර තිබුණද ගොවිපොල සතු සත්ත්ව ලේඛන (එළගව, මී ගව, කුකුළු, ඌරු, එළු) නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා එම ජීව තොගයේ වටිනාකම නිවැරදිව සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

විශ්වවිද්‍යාලය සමඟ ඇති කරගෙන තිබූ ගිවිසුම් කඩකළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 13 දක්වා කාලයක් තිස්සේ රු.10,324,920 ක් අයවීමට තිබූ අතර එකී මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**2.4 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XIX වැනි පරිච්ඡේදය | |
| - 4.3.3 වගන්තිය | කාර්ය මණ්ඩල නිවාස ඉල්ලුම් කරන නිළධාරීන් සම්බන්ධයෙන් පොරොත්තු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| - 6.1 වගන්තිය | කිසියම් තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 5 ක් ලෙස දක්වා තිබුණද එයට පටහැනිව දීර්ඝ කාලීනව එකම නිළධාරියා නිවාසවල පදිංචිව සිටින බව අනාවරණය විය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 317 | වෛද්‍ය පීඨයේ මුදල් අයකැමි භාරයේ පවතින සේප්පුවේ යතුරු දෙකම අයකැමි භාරයේ වූ අතර මාණ්ඩලික නිළධාරියෙකුට එක් යතුරක් පවරා නොතිබුණි. විගණිත දිනය වූ 2014 සැප්තැම්බර් 29 දින අයකැමි භාරයේ රු.519,840 ක් හා එකතුව රු.1,220,000 ක් වූ වැටුප් පැකට් 40 ක් තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් ලබාගෙන එම කාර්යය නිමකළ විගසම අත්තිකාරම් පියවීමට කටයුතු කළයුතු වුවද 2014 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 18 දෙනෙකුට හා ආයතන 3 කට ගෙවා තිබුණු රු.674,298 ක අත්තිකාරම් 2015 ජුනි 10 දින වන විටත් පියවීමට හෝ අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 394 | අවලංගු කළ චෙක්පත්වල වටිනාකම ලැබුණු මුදලක් ලෙස සලකා එය නියමිත ආදායම් ගිණුමට බැරකළ යුතු වුවද රු.210,670 ක් වටිනා අවලංගු කළ චෙක්පත් 19 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 1646 | සෑම මාසයකම දෛනික ධාවන සටහන් ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද කෘෂි පීඨයට අයත් වාහන 06 ක 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මාස වලට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර අදාල ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණෙන හා පිටවන වේලාව එම ලේඛනයේ සටහන් කළ යුතු බව දැක්වෙතත් විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිළධාරීන්ගේ පැමිණීමේ හා පිටවීමේ ලේඛනය හා නිවාඩු ලේඛන ඉදිරිපත් කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබූණු රු.886,860,747 ක වැටුප් හා දීමනා විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය සතු ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණු අතර රු.47,071,914 ක් වටිනා පරිගණක මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය සමඟ ඇති කරගත් ගිවිසුම් කඩකළ පුද්ගලයන්ගෙන් ලැබෙන සියලුම මුදල්, පොලී මුදලක් ලැබෙන ස්ථාවර තැන්පතු/භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළයුතු බව දැක්වේ. නමුත් එසේ ගිවිසුම් කඩකළ පුද්ගලයින්ගෙන් 2014 දෙසැම්බර් 31 දක්වා රු. 41,729,919 ක් විශ්වවිද්‍යාලය අයකර ගෙන තිබුණද එම මුදල් කිසිවක් ආයෝජනය කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

Norad’s programme for Master studies and startup Fund සහ Norvigien program for Development, Research and Evaluation යන විදේශාධාර ව්‍යාපෘති වෙනුවෙන් කළමනාකරණ හා මූල්‍ය පීඨයට අදාල මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ලැබී තිබුණු රු.4,045,505 ක් ව්‍යාපෘතිවල අරමුණු වලට නොයොදා අදාල ආධාර ලබාදුන් පාර්ශවයේ අනුමැතියක්ද රහිතව උපකුලපති අරමුදලට මාරු කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.42,348,000 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.164,624,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.206,972,000 කින් වර්ධනය වී තිබුණි.

### 3.2 විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු දෙකක් හා විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ හා කම්කරු විනිශ්චය සභාවේ ගොනු කරන ලද නඩු 19 ක් ද පැවතුණි. විශ්වවිද්‍යාලය විසින් දිසා අධිකරණයේ පවරා ඇති නඩුවට අදාලව අයවිය යුතු මුදල රු. 5,282,110 ක් වූ අතර විශ්වවිද්‍යාලයට එරෙහිව පවරා ඇති නඩු 19 න් නඩු තුනකින් ඉල්ලා ඇති වන්දි මුදල රු.31,505,977 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන සිසුන් දෙදෙනෙකු විසින් 2012, 2013 හා 2014 වර්ෂවලට අදාලව එකතුව රු. 74,000 ක ශිෂ්‍යාධාර වාරික 31ක් හා මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨයේ 2012 වර්ෂයේ ලියාපදිංචි සිසුන් 23 දෙනෙකු විසින් එකතුව රු.562,800 ක ශිෂ්‍යාධාර වාරික 253 ක් ලබාගෙන නොතිබුණු අතර එම මුදල් නොගෙවූ ශිෂ්‍යාධාර ගිණුමට දිගින් දිගටම බැරවී තිබුණි. ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කිසිදු පරීක්ෂාවක් කර නොතිබුණි.

(ආ) ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මගින් ක්‍රියාත්මක කර තිබූ Specific Agreement an Research Cooperation between the Swedish International Development Cooperation Agency ව්‍යාපෘතිය යටතේ 2006 හා 2010 කාලපරිච්ඡේදය තුල ආසන්න වශයෙන් රු. 26,463,266 ක් වටිනා වත්කම් මිලදී ගෙන තිබුණු අතර ව්‍යාපෘතිය අවසන් වී වසර 4 කට ආසන්න කාලයක් ගත වී තිබුණද එකී වත්කම් විශ්වවිද්‍යාලය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 නොවැම්බර් 08 දින සිට මත්ස්‍ය ජීව විද්‍යා අධ්‍යයනාංශය, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය බවට පත්කර තිබුණු අතර එහිදී මත්ස්‍ය ජීව විද්‍යා අධ්‍යයනාංශය යටතේ පැවති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අළුතින් ස්ථාපිත කර තිබූ පීඨයේ කාර්යාල හා අනෙකුත් අධ්‍යයනාංශ අතර බෙදා දී ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත් පරිදි සකස් කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. විගණන දිනය වන විට පවත්වාගෙන ගොස් තිබූ ඉන්වෙන්ට්‍රි ලේඛනද විධිමත් හා පොදු 44 ආකෘතියේ ලේඛන නොවිය.

(ඈ) 1997 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල කෘෂි පීඨ ගබඩාවට ලැබී තිබූ රු. 103,588 ක් වටිනා විවිධ ලිපිද්‍රව්‍ය ස්වරූපයේ භාණ්ඩ හා කඩදාසි වර්ග 14 ක් දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් නොවී ගබඩාවේ තිබුණු අතර ඒවා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විභාගශාලාව සඳහා ලියන මේස 250 ක් මිලදී ගැනීමේදී නියමිත දිනට වඩා දින 107 ක් ප්‍රමාද වී භාණ්ඩ සපයා තිබුණද ගිවිසුම් ප්‍රකාරව අයකර ගත යුතු රු.60,856 ක ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමකින් තොරව රු.1,137,500 ක් ගෙවා තිබුණි.

(ඊ) ශාරීරික අධ්‍යාපන අංශයෙන් ශිෂ්‍යයන් වෙත ක්‍රීඩා භාණ්ඩ නිකුත් කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී වසර 01 සිට වසර 10 දක්වා කාල පරාසයක් තුල නිකුත් කරන ලද ක්‍රීඩා භාණ්ඩ නැවත භාර දීමක් කර නොතිබූ අවස්ථා 38 ක් අනාවරණය වූ අතර එකී ක්‍රීඩා භාණ්ඩ නැවත ලබා ගැනීමට හෝ වටිනාකම අයකර ගැනීමට හෝ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාලය සතු නිවාසවල පදිංචිකරුවන්ගෙන් 2013 ජුනි 10 දින පැවති පාලක සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණය අනුව නිවාස කුලිය අය නොකිරීම හේතුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයන් 87 දෙනෙකුගෙන් නිවාස කුලිය රු.1,422,025 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පුස්තකාල පොත් හා වාර සඟරා මිලට ගැනීම වෙනුවෙන් ගෙවන ලද රු. 1,396,917 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා පියවා නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු අංශයෙන් ලබාගත් තොරතුරු අනුව විශ්වවිද්‍යාලයේ පවත්වාගෙන ගොස් තිබූ විවිධ අධ්‍යයන පාඨමාලා 11 ක් සඳහා ඇතුළත් කරගත හැකිව තිබූ සිසුන් සංඛ්‍යාව 1,145 ක් වී තිබුණද 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කරගෙන තිබුණේ සිසුන් 920 ක් පමණි. ඒ අනුව පාඨමාලා 11 සඳහා විශ්වවිද්‍යාල වරම් ලබා සිටි සිසුන් 225 දෙනෙකු සඳහා උසස් අධ්‍යාපනය ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී ගොස් තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) Norad's programme for Masters studies and startup Fund සහ Norvigien programme for Development, Research and Evaluation යන විදේශාධාර ව්‍යාපෘති දෙකට අදාලව නෝර්වේහි - නොඩ්ලන්ඩ් විශ්වවිද්‍යාලය (University of Nordland) හා රුහුණ විශ්වවිද්‍යාලය ඒකාබද්ධව කරන ලද ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමට අදාල පර්යේෂණාත්මක පොත් ව්‍යාපෘතිය සඳහා මෙරට දායකත්වය වශයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකුට රු. 780,000 ක් 2011 වර්ෂයේදී ගෙවා තිබුණද අදාල පොතෙහි පිටපතක් 2015 ජුනි 10 දක්වාම රුහුණ විශ්වවිද්‍යාලය වෙත ලැබුණු බවට කිසිදු සාක්ෂියක් නොවිය.

(ආ) වෛද්‍ය පීඨයේ සිසුන් 115 දෙනෙකු සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් 2012 ජනවාරි 02 දින තක්සේරු වාර්තාවක් ලබාගැනීමකින් තොරව රු. 115,000 ක මාසික කුලියකට ගෙන තිබුණි. කෙසේ වුවද 2014 සැප්තැම්බර් 09 දින ලබා ගන්නා ලද තක්සේරු වාර්තාව අනුව කුලී වටිනාකම රු. 80,000 ක් වූයෙන් 2012 ජනවාරි 02 දින සිට 2014 ඔක්තෝබර් 02 දින දක්වා රජයේ තක්සේරු වටිනාකමට වඩා රු. 702,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) කළමනාකරණ හා මුල්‍ය පීඨයේ දේශන ශාලා සඳහා ලියන මේස හා බංකු 84 ක් සපයා සවිකර ගැනීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත රු.8,928,192 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද ලබාදී ඇති පිරිවිතර වලට අනුකූල නොවන අයුරින් ලියන මේස හා බංකු සපයා සවිකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.432,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශිෂ්‍යාධාර ගිණුමේ ශේෂය රු. 4,511,350 ක් වී තිබුණු අතර එකී ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 8,602,050 දක්වා සියයට 91 කින් වැඩි වී තිබුණි. එසේ වැඩිවීමට හේතු විගණනයට අනාවරණය නොවීය.

(ඉ) සම්බෝධි භාරකාර මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලය වෙත පරිත්‍යාග කරන ලද රූඩ් 2 පර්චස් 1.9 ක් වූ ඉඩම හා ගොඩනැගිල්ල, පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ උත්සව කටයුතු සඳහා 2013 අගෝස්තු 23 දින නාගරික සංවර්ධන අධිකාරියට තාවකාලිකව භාරදී තිබුණි. මෙම ඉඩම හා ගොඩනැගිල්ල නැවත ලබාදෙන ලෙස 2014 ජනවාරි 27 දින නාගරික සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන්ද 2014 අප්‍රේල් 10 දින රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන්ද ඉල්ලීම්කර තිබුණද මේ දක්වා අදාල දේපල විශ්වවිද්‍යාලයට නැවත භාරදී නොතිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

විශ්වවිද්‍යාලයේ ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මගින් Specific Agreement on Research Co-operation between the Swedish International Development Co-operation Agency නම් වූ ව්‍යාපෘතිය 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා රු. 45,300,469 ක ස්වීඩන් ආධාර ලැබී තිබුණි. එම ව්‍යාපෘතිය 2010 දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක වී තිබූ අතර විගණනය වෙත ඉදිරිපත් වූ තොරතුරු අනුව ප්‍රතිපාදන මුදලින් රු. 30,704,916 ක් පමණක් වියදම් කර තිබුණි. ඉතිරි රු. 14,595,553 ක් උපයෝජනය කිරීමකින් තොරව ආපසු යවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රවණාගාරය සඳහා ප්‍රයෝජනයට ගත හැකි ආලෝකකරණ උපාංග 31 කට අදාල ඒකක 1,322ක් 1983 වර්ෂයේ සිට හා 1998 අගෝස්තු 14 දින ප්‍රධාන ගබඩාවට ලැබී තිබූ රසායන ද්‍රව්‍ය 40 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ආ) රු. 8,718 ක් වටිනා ගෑස් උඳුනක් 2014 ජුනි 14 දින ඉංජිනේරු පීඨයේ ගබඩාවට ලැබී තිබුණද විගණන දිනය වූ 2014 නොවැම්බර් 27 දක්වාම එය ඉල්ලුම් කර තිබූ පාර්ශවය වෙත නිකුත් නොකර ගබඩාවේ තබාගෙන තිබුණි. තවද විවිධ ලිපිද්‍රව්‍ය වර්ග 06 කට අදාල අයිතම 83ක් වසර ගණනාවක් තිස්සේ බඩු වට්ටෝරු ලේඛනයේ ශේෂයක් වශයෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) ශිෂ්‍ය නේවාසිකාගාරයක් අසල ස්ථාපිත කර තිබූ K.V.S. 85 විදුලි උත්පාදක යන්ත්‍රය 2012 ජනවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 60,234 ක් වූ බැංකු ගිණුම් 02 ක ශේෂ අක්‍රිය තත්ත්වයේ පවතින බැව් විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වෛද්‍ය පීඨයේ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ ප්‍රදාන යටතේ ලබා දී තිබූ රු. 1,824,346 ක් සමාලෝචිත වර්ෂය තුල එකී ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් නිෂ්ක්‍රීයව ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ලංකා බැංකුවේ රු. 811,535 ක ශේෂය 2007 වර්ෂයේ සිට නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයක් වශයෙන් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද කටයුතු කර නොතිබුණි.

## 4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයාට එකතුව රු. 1,700,260 ක් ගෙවා තිබුණද 2014 දෙසැම්බර් 31 දක්වාද එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) රුහුණ විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින් ඉහළ උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා රජය මගින් මූල්‍ය ආධාර හා වැටුප් සහිත නිවාඩු ලබාදී තිබුණද අදාල පශ්චාත් උපාධි සම්පූර්ණ කළ බව සනාථ නොවන අවස්ථා 20 ක් නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය. එම අවස්ථා 20න් මහාචාර්ය හා කථිකාචාර්යවරුන් 12 දෙනෙකු සඳහා පමණක් රු.9,890,511 ක් රජය මගින් ගෙවා තිබුණි. ඉතිරි ආචාර්ය හා මහාචාර්යවරුන් 8 දෙනා සඳහා ගෙවා තිබූ මුදල් පිළිබඳ තොරතුරු පෞද්ගලික ලිපිගොනුවලින් අනාවරණය කර ගැනීමට නොහැකි විය .

(ඇ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාල බව හා ගුණාත්මකභාවය වැඩි කිරීමේ ව්‍යාපෘතිය යටතේ එකතුව රු. 7,512,491 කට මිලදී ගෙන තිබුණු පොත් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයට ලබා නොදී, විවිධ අධ්‍යයනාංශ වෙත ලබාදීම තුලින් දරන ලද වියදමෙන් වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා ගැනීමට තිබුණු අවස්ථා අහිමි කර තිබුණි.

(ඈ) ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මගින් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබූ Specific Agreement on Research Co-operation between the Swedish International Development Co-operation Agency යන ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා තාවකාලික කථිකාචාර්යවරයෙකු ඇතුළුව කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට කිසිදු ඇප බැඳුම්කරයකින් තොරව එකතුව රු. 1,740,622 ක මූල්‍යාධාර සපයා තිබුණි. කථිකාචාර්යවරුන් දෙදෙනාම දැනට විශ්වවිද්‍යාලය තුල සේවය නොකරන බව අනාවරණය විය. ඒ අනුව උක්ත වියදමට සරිලන කිසිදු ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලයට ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) කෘෂි පීඨය සතු ධාවන තත්ත්වයේ නොතිබුණු යතුරු පැදි හා ට්‍රැක්ටර් රථ එකතුව 06 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට රු. 16,841 ක් ජාතික රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණි.

(ඊ) කෘෂි පීඨයේ ආහාර හා තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ ජර්මනියේ Sandberg Schneidewind ආයතනයෙන් මිලදී ගැනීම සඳහා වසර 03 කට පෙර රු. 751,463 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. උපකරණ විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණද සමාලෝචිත වර්ෂයේ මාර්තු දක්වා කිසිදු පසු විපරම් ක්‍රියාමාර්ගයක් නොගෙන එකී උපකරණ ඉන්දියාවේ Lab Chemicals ආයතනයෙන් රු. 329,179 ක් වැයකර ආනයනය කර තිබුණි. එසේ මිලදී ගෙන තිබුණු උපකරණ වලින් කොටසක් ඇනවුම්

නොකරන ලද උපකරණ වූ අතර තවත් උපකරණ කොටසක් ලැබී නොතිබුණි. ලැබී තිබූ විදුලි තරාදියේ ප්‍රධාන ස්විචය ක්‍රියාත්මක නොවීම නිසා භාවිතයට ගත නොහැකි වී තිබුණි. විවිධ අඩුපාඩු සහිත උපකරණ විශ්වවිද්‍යාලයට ලැබී වසරකට අධික කාලයක් ගත වී තිබුණද විගණන දිනය වූ 2014 දෙසැම්බර් 19 දක්වාම ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**4.7 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාපලාන කෘෂි පීඨයට අයත් වාහන 4 ක සහ විශ්වවිද්‍යාලයීය බස් රථය සඳහා 2014 ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබා නොගැනීම හේතුවෙන් දඩ මුදල් වශයෙන් රු.16,012 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) රජයේ මුදල් රෙගුලාසි 387 ප්‍රකාරව චෙක්පත් මගින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිළධාරියා විසින් නිතරම සොයාබැලිය යුතු අතර රජයේ කිසිදු බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් කර තිබුණි. නමුත් ඊට පටහැනිව 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විශ්වවිද්‍යාලයේ ජංගම ගිණුම් 02 ට අදාලව රු. 93,112 ක් බැංකු අයිරා පොලී ලෙස ගෙවීම් කර තිබුණි.

(ඇ) කෘෂි පීඨයේ වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා මිලදීගෙන තිබූ ඖෂධ පිළිබඳ සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ඖෂධ වර්ග 46 ක් කල් ඉකුත් වී තිබුණු අතර ඉන් ඖෂධ 27 ක වටිනාකම රු. 23,899 ක් විය. එසේ ඖෂධ කල් ඉකුත්වීමට පෙර ඒවා විශ්වවිද්‍යාලයේ වෙනත් වෛද්‍ය මධ්‍යස්ථාන වෙත ලබාදීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

**අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත කථිකාචාර්යවරුන්ගේ (ආධුනික කථිකාචාර්යවරුන්ද ඇතුළත්ව) සංඛ්‍යාව 601 ක් වුවද 2015 ජුනි 01 දිනට තත්‍ය සංඛ්‍යාව 477 ක් වූයෙන් තනතුරු 124 ක පුරප්පාඩු පැවතුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 152 ක පුරප්පාඩු පැවති අතර තත්‍ය කාර්ය මණ්ඩලය තුල අනුමැතිය ලැබී නොතිබූ තනතුරු සංඛ්‍යාව 64 ක් විය.

**4.9 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රුහුණ විශ්වවිද්‍යාලය සතු කාර් රථයක් 2013 හා 2014 වර්ෂවල රු. 188,722 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු අතර 2014 අප්‍රේල් මාසයෙන් පසු රථය ධාවනයේ යොදවා නොතිබුණි. 2015 ජනවාරි 21 දින දක්වාම රථය නැවත අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2007 වර්ෂයේ විශ්වවිද්‍යාලයට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු බස් රථය 2012 වර්ෂයේ සිට අවස්ථා දෙකකදී රු. 748,360 ක එන්ජින් අලුත්වැඩියාවක් කර තිබුණි. එහි වගකීම් කාලය හෝ ධාවනය කරන ලද කිලෝමීටර් සංඛ්‍යාව සම්පූර්ණ වීමට පෙර 2014 ජුනි 16 දින රු. 260,280 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නැවත අලුත්වැඩියාව සඳහා ගිවිසුමකින්

තොරව එම ගරාජයටම භාර දී තිබුණි. 2015 අප්‍රේල් 30 දින වන විටත් අලුත්වැඩියා නොකර බස් රථය ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් අනාරක්ෂිතව නවතා තිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 11 කට අදාලව එහි සියයට 20 සිට 327 ක පරාසයක් දක්වා විචලනයන් නිරීක්ෂණය විය.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 සහ 2013 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම 2015 අප්‍රේල් 09 දින දක්වා සිදු කර නොතිබුණි.

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

2012 ඔක්තෝබර් 04 දින පවත්වන ලද අංක 73 දරන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විශ්වවිද්‍යාලය සතු නිල නිවාස වල පදිංචි වී සිටින නිළධාරීන්ගෙන් නිවාස කුලිය අය කිරීම පිළිබඳ සාකච්ඡා කර තීරණයකට එළඹ තිබූ නමුත් මෙම තීරණය ක්‍රියාත්මක කිරීම 2015 අප්‍රේල් 15 දින දක්වා සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය.
(ඇ) නිල නිවාස කුලී අයකිරීම
(ඈ) ගබඩා පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) නේවාසිකාගාර පාලනය
(උ) ණයගැති හා ණයහිමි පාලනය